පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக்கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය-2019**

**(ඔක්තෝම්බර් 2019)**

**ඉතිහාසය V (HG 5)**

**ක්‍රි ව 1500 සිට 1948 දක්වා ශ්‍රී ලංකාවේ ඉතිහාසය**

කාලය පැය **තුන** (03) යි.

යටත් පිරිසෙයින් **එක්** කොටසකින් **එක්** ප්‍රශ්ණය බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

සුදුසු තන්හි ඔබේ පිළිතුරු දළ සිතියම් මගින් පහදන්න.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපාහරිනු ලැබේ.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **දොළස (12)** කි.

---

**පළමුවන කොටස**

1. ක්‍රි. ව. 1505 න් පසු ශ්‍රී ලංකාවේ කෝට්ටේ රාජධානිය හා පෘතුගීසීන් අතර පැවති සබඳතාවය පහදන්න.
2. ලංකාවේ පෘතුගීසි පාලනයේ දායාදයන් විචාරාත්මකව පැහැදිලි කරන්න.
3. උඩරට රාජධානියේ පරිපාලන ව්‍යුහයේ ප්‍රධාන ලක්ෂණ පෙන්වා දෙන්න.

**දෙවන කොටස**

4. ලන්දේසීන් හා දෙවන රාජසිංහ රජු අතර පැවති සබඳතාවය විචාරාත්මකව සාකච්ඡා කරන්න.
5. ලංකාවේ ලන්දේසි ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රධාන අංග ලක්ෂණ පරීක්ෂා කරන්න.
6. "උඩරට රාජධානිය බිඳවැටුනේ රජු සහ රදළයන් අතර පැවති බලඅරගලය නිසා පමණක් නොවේ" මෙම ප්‍රකාශය විග්‍රහ කරන්න.

## තුන්වන කොටස

7. 1818 උඩරට කැරැල්ල අසාර්ථක වීමට බලපෑ හේතු පෙන්වාදෙන්න.

8. කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණයෙහි ප්‍රධාන නිර්දේශයන් සාකච්ඡා කරන්න.

9. 19 වන සියවසේ දෙවන භාගය තුළ ලංකාවේ සංස්කෘතික පුනර්ජීවන ව්‍යාපාරය ඉස්මතු වූ හා වර්ධනය වූ සමාජ සන්දර්භය පරීක්ෂා කරන්න.

## හතරවන කොටස

10. 1931 දී ශ්‍රී ලංකාවට සර්වජන ඡන්ද බලය හඳුන්වාදීමේ දේශපාලන ප්‍රතිඵල කවරේද?

11. ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ ප්‍රභවය හා වර්ධනය විචාරාත්මකව විග්‍රහ කරන්න.

12. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.

    1. යාපනය රාජධානිය
    2. ඇහැලේපොළ අදිකාරම්
    3. කෝපි වතුවගාව
    4. ඩොමීනියන් තත්ත්වය